පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 79

ආයතනයේ නම : කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ඇස්මුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம்: 79

நிறுவனத்தின் பெயர்: கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சு

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் நிறுவனங்களினிற்குப் பெறுப்பான கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடாபாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

Parliamentary Series No: 79

Name of the institution: Ministry of Agriculture, Livestock, Lands and Irrigation

Submission of observations of the Hon. Minister in charge of the institutions and Steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : අංක 79

ආයතනයේ නම : කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මූල්‍ය අනුකූලතාවය සහ මෙහෙයුම් කාර්යසාධනය පිළිබඳව මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මගින් ඇගයීම - 2022 මුදල් වර්ෂය	
කෘෂිකර්ම අමාත්‍යාංශය **පළමු කොටස : 80.00**	
කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු / කාරක සභාව විසින් දෙන ලද නියෝග	කමිටුව විසින් පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කිරීමට / නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ගත් ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	හැකි සෑම විටම විගණන විමසුම් සඳහා අප්‍රමාදව පිළිතුරු සැපයීමට කටයුතු කරන අතර මේ පිළිබඳව සියලු නිලධාරීන් වෙතද යළි දැනුවත් කිරීම් කර ඇත.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කර නොතිබීම.	හැකි සෑම විටම විගණන විමසුම් සඳහා අප්‍රමාදව පිළිතුරු සැපයීමට කටයුතු කරන අතර මේ පිළිබඳව සියලු නිලධාරීන් වෙතද යළි දැනුවත් කිරීම් කර ඇත.
සියලු වාහන වල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	කෘෂිකර්ම අංශය විසින් භාවිතා කරනු ලබන වාහන 52 අතුරින් වාහන 38 ක අයිතිය තහවුරු කරන ලිපි අමාත්‍යාංශය සන්තකයේ ඇති අතර, තවත් වාහන 14 ක අයිතිය වෙනත් ආයතනය නමින් ඇති බවත් ඉන් වාහන 04 ක් මෙම අමාත්‍යාංශය වෙත පවරාදීමට එකඟතාවය ලැබී ඇති අතර, ඉතිරි වාහන ද එම ආයතන වල කැමැත්ත මත පවරා ගැනීමට හෝ නැවත බාර දීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව ද දන්වා සිටිමි.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාර
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්

සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	සංචිත වාහන වල දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා මාසිකව විගණකාධිපති වෙත යොමු කර ඇත.
සියලු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	සෑම වාහනයකම රාජ්‍ය ලාංඡනය අලවා ඇති අතර ඉදිරියේදී සියලු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.
සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි.	සෑම ලොග් පොතක්ම යාවත්කාලීන කර ඇති බව දන්වා සිටිමි.
සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට පවත එමින් තිබූ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර නොතිබුණි.	කෘෂිකර්ම අංශයට අදාළ නොවේ. නිරවුල් නොකළ අක්‍රීය බැංකු ගිණුම් නොමැත.
මු.රෙ.94 (1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇතිකර ගෙන තිබුණි.	හැකි සෑම විටම ප්‍රතිපාදන තුල රැඳී සිටීමට කටයුතු කර ඇත. කෙසේ නමුත් මු.රෙ. 94 (2) යටතේ ඇතැම් බැඳීම් ඇතිකර ගැනීමට සිදුවී ඇති අතර, ඉදිරියේදී ප්‍රතිපාදන තුළ රැඳෙමින් බැරකම් කළමනාකරණය කර ගැනීමට කටයුතු කිරීමට අපේක්ෂිතය.
නියමිත කාලයෙන් බැහැරව ප්‍රතිපාදන වෙනත් ආයතන වෙත වෙන් කර ඇත.	වෙනත් ආයතන වල කාර්යසාධන සැලැස්ම අනුව ප්‍රතිපාදන ලබාදීම සිදුකර ඇත.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාර
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. විකුමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කරමින් පවතී.
පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	කෘෂිකර්ම අංශයට අදාළ නොවේ.
මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම නිසි සුපරීක්ෂණයක් සිදු කර කඩිනමින් පියවාගැනීමට උපදෙස් ලබා දී ඒ අනුව කටයුතු කරනු ලැබේ.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල

දෙවන කොටස : 76.00	
2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.	2018 01.24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව 2024 වර්ෂය සඳහා නිසි පරිදි මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර ඇත.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් 50% කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	2022 වර්ෂයේ සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% කට වඩා අඩු මට්ටමක් පැවතීමට හේතු වූයේ කොවිඩ් 19 වසංගත තත්ත්වය පාලනය කිරීම සම්බන්ධයෙන් ජනාධිපති ලේකම් කාර්යාලය සහ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් හා රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ලැබූ පහත සඳහන් ලිපි හා චක්‍රලේඛ අනුව රාජකාරී කටයුතු සඳහා නිලධාරීන් කාර්යාල වෙත කැඳවීම සීමා කිරීම හා පුද්ගලයින් ඒකරාශි වී කටයුතු කිරීම සීමා කිරීම මය වේ. I. පවතින සම්පත් තිහය මත රාජ්‍ය වියදම් අවම කිරීම සඳහා රාජ්‍ය ආයතන වල සේවය මණ්ඩල කැඳවීම සීමා කිරීම සම්බන්ධව දැනුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2022 හා 2022.05.25 දිනැති චක්‍රලේඛය. II. රාජ්‍ය නිලධාරීන්ට එක් දිනක් නිවසේ රැඳී සිට කෘෂිකාර්මික හා වගා කටයුතු යෙදීමට අවස්ථාව සලසා දීම සම්බන්ධව නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/2022 හා 2022.05.15 දිනැති චක්‍රලේඛය හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/2022(I) හා 2022.08.03 දිනැති චක්‍රලේඛය III. රජයේ කාර්යාල වෙත නිලධාරීන් කැඳවීම සීමා කිරීම සම්බන්ධව නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 16/2022 හා 2022.06.07 දිනැති චක්‍රලේඛය. IV. රජයේ කාර්යාල වෙත නිලධාරීන් කැඳවීම සීමා කිරීම සම්බන්ධව නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 16/2022(I) හා 2022.06.26 දිනැති චක්‍රලේඛය. V. රජයේ කාර්යාල වෙත නිලධාරීන් කැඳවීම සීමා කිරීම සම්බන්ධව නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 16/2022(II) හා 2022.07.24 දිනැති චක්‍රලේඛය.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

	VI. රජයේ කාර්යාල වෙත නිලධාරීන් කැඳවීම සීමා කිරීම සම්බන්ධව නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන ලේකම්ගේ අංක PUB/ ADM/SEC/07 හා 2022.06.27 දිනැති ලිපිය. VII. රාජ්‍ය වියදම් පාලනය කිරීම සම්බන්ධ අංක 03/2022 හා 2022.04.26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛය.
සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුලත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	2022 වර්ෂය සඳහා සමස්ථ කාර්ය මණ්ඩලය ඇතුළත් කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගත කර ඇත.
මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමට ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුල ජ්‍යෙෂ්ඨ නිලධාරියකු නම් කර නොතිබුණි.	මානව සංවර්ධන සැලසුම් සකස් කිරීමට, ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුල ජ්‍යෙෂ්ඨ නිලධාරියකු නම් කර ඇත.
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	ඉහත සඳහන් හේතු අනුව, 2022 වර්ෂයේ සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% වඩා අඩු මට්ටමක පැවතුණි. මේ වන විට 2023 වර්ෂයේ සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් 80% වඩා පුහුණු අවස්ථා නිලධාරීන් වෙත ලබා දී ඇති අතර, 2024 වර්ෂයේ නිලධාරීන් සඳහා පුහුණුවීම් ආරම්භ කර ඇත.

වල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, [illegible]

ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අභිතකර මට්ටමේ විය.	2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය අනුව විගණන මතය තත්ත්වාගණනය කළ මතයක් විය. අතර මතය ව්‍යාවනය කර හෝ අභිතකර මට්ටමේ මතයක් ඉදිරිපත් කර නොමැත.
විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොගිණුණි.	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර ඇත.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාර්
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

වැවිලි අමාත්‍යාංශය **පළමු කොටස : 97.00**	
කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු / කාරක සභාව විසින් දෙන ලද නියෝග	**කම්ටුව විසින් පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කිරීමට / නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ගත් ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය**
අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	අවදානම් ලේඛනය යාවත්කාලීන කරමින් පවත්වාගෙන යනු ලැබේ.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	**01.<u>ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු මුදල</u>** **එච්.ඩී.කේ.ගොඩවින් මයා (කාර්යාල කාර්ය සහායක) - රු.36,116.00** රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2024 අනුව 2024 වර්ෂය තුළදී කපාහැරීමට කටයුතු කරනු ලැබේ. **02.<u>වැඩ තහනම් කර ඇති නිලධාරීන්ගෙන් අයවිය යුතු මුදල</u>** **ඩබ්.ඒ.එල්.ජී.විජේසිංහ මයා - රු. 255,997.00** මෙම කාරණය හා අදාළව නඩුවක් ගොනු කිරීමට නොව වෙන්දේසිය ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව ඉඩම ලබා ගන්නා අයට ඔප්පුව ලිවීමේදී එය එය අමාත්‍යාංශය ලේකම්ට සිදු කළ හැකි ද යන්න පිළිබඳව සහ වෙන්දේසියේදී රජයට අයවිය යුතු මුදලට වඩා අතිරික්ත මුදලක් ලැබුනහොත් එම මුදල සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ක්‍රමවේදය පිළිබඳවත් 2020.09.11 දිනැතිව නීතිපති වෙතින් උපදෙස් ඉල්ලා සිටින ලදි. එයට 2021.01.07 දිනැතිව පිළිතුරක් ලබා දෙමින් නීතිපති දෙපාර්තමේන්තුව දන්වා ඇත්තේ ඉඩම වෙන්දේසි කිරීමටත් ඉන්පසුව පැවරීමටත් අමාත්‍යාංශ ලේකම්ට බලය ඇති බවට ප්‍රකාශ කරගැනීම සඳහා සිවිල් නඩු විධාන සංග්‍රහයේ 628 වගන්තිය ප්‍රකාරව අදාළ දිසා අධිකරණයේ නඩු පවරා ප්‍රකාශන නියෝගයක් ලබාගත යුතු බවය. ඒ අනුව, අවශ්‍ය කටයුතු සිදුකර දෙන ලෙසට 2021.02.12 වන දින නැවත නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කර ඇති අතර 2021.10.13, 2022.09.28 සහ 2022.12.08 යන දිනයන්හි සිහිකැඳවීම් යොමුකර ඇති අතර අනතුරුව 2022.10 දින රහිත ලිපියකින් නීතිපති දෙපාර්තමේන්තුව

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

තොරතුරු කිහිපයක් ඉල්ලා තිබුණි. එම තොරතුරු අදාළ අංශ වෙතින් ලබාගෙන 2023.01.30 වන දින නීතිපති වෙත යොමුකර ඇත. ඉන් අනතුරුව 2023.04.12 වන දින නැවත සිහිකැඳවීමක් යොමු කර ඇති අතර 2023.04.17 වන දින පූර්ව නීති සාකච්ඡාවක් ද පවත්වා ඇත. එහිදී ඉල්ලා සිටි ලේඛන 2023.04.20 වන දින ලබා දී ඇති අතර නැවත 2023.06.21 වන දින නීතිපති දෙපාර්තමේන්තුවෙන් තොරතුරු ඉල්ලීමක් සිදු කර ඇත. එම තොරතුරු ද 2023.09.20 වන දින ලබා දී ඇත.

මේ වනවිට මෙම ගොනුව රජයේ නීතිඥවරු 4-5 දෙනෙකු අතට පත්ව ඇති අතර පසුගිය සතියේ සිදු කළ පරීක්ෂාවේදී නැවතත් නව නීතිඥයෙකු වෙත භාර දී ඇත. දුරකථනයෙන් සිදුකළ විමසීමකදී 2024.07.23 වන දින ඇය දන්වා ඇත්තේ ඇයට ද එම ගොනුව අධ්‍යයනය කළ යුතු නිසා කාලය අවශ්‍ය බවය.

ඇටර්නි බලපත්‍රය රජය වෙනුවෙන් පවතින උපනන්ද විදාන පතිරණ මහතාට මෙම ඔප්පුව අත්සන් කර දෙන ලෙස දුරකථනයෙන් දන්වා ඇතත්, ඔහු එය ප්‍රතික්ෂේප කරන ලද හෙයින් ඉහත අධිකරණමය කටයුත්ත ක්‍රියාත්මක කළ යුතුව ඇත. ඒ සඳහා නීතිපති දෙපාර්තමේන්තුව අවශ්‍ය මැදිහත්වීම කඩිනමින් ලබා නොදෙන්නේ නම් පෞද්ගලික නීතිඥවරයෙකු මාර්ගයෙන් (අමාත්‍ය මණ්ඩල සංදේශයේ පවතින ක්‍රමවේදය අනුගමනය කර) හෝ පියවර ගෙන ක්‍රියාත්මක විය හැකි වන්නේ නම් මුදල් ලබා ගැනීමට දේපොළ වෙන්දේසිය නෛතිකව ක්‍රියාත්මක කළ හැකි වනු ඇත.

ඊ.එල්.ලයනල් මයා (කාර්යාල කාර්ය සහායක) - රු.30,760.00

රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2024 අනුව 2024 වර්ෂය තුළදී කපාහැරීමට කටයුතු කරනු ලැබේ.

නිශාන්ත විජේකෝන් මයා (කාර්යාල කාර්ය සහායක) - රු.111,754.00

මෙම නඩුවට අදාළව ගෙවීම් සිදු කිරීම පැහැර හැරීම මත මෙම පුද්ගලයාගේ දේපොළ තහනමට ගෙන මුදල් අය කරගැනීම සඳහා ඇස්කිසි ගොනු කිරීමට 2017.06.23 වන දිනැතිව නීතිපති වෙත ඉල්ලීමක් කළ අතර ඒ අනුව නීතිපති දෙපාර්තමේන්තුව ඇස්කිසි ගොනු කිරීමට පියවර ගෙන තිබුණි. නමුත් ඇස්කිසි නිවැරදිව ගොනුකර නොමැති බව දන්වමින් ගරු දිසා අධිකරණ විනිසුරුතුමා ඉල්ලීම් ප්‍රතික්ෂේප කර ඇති බව අධිකරණයේ නඩු ගොනුව පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය වූ හෙයින් 2023.12.18 දිනැතිව ඒ බව නීතිපති දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව දන්වා ඇත. ඉන් අනතුරුව 2024.02.14 දිනැතිව නීතිපති දෙපාර්තමේන්තුව නියෝගයේ පිටපතක් ලබාගෙන ඉදිරිපත් කරන ලෙසට අප වෙත දන්වා තිබූ අතර එය 2024.03.04 වන දින යොමු කර ඇත. නැවත 2024.07.01 දිනැතිව නීතිපති දෙපාර්තමේන්තුව දන්වා ඇත්තේ පැමිණිලිකරුගේ

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරි
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

සමත තීන්දු ප්‍රකාශයේ පිටපතක් ලබාගෙන ඉදිරිපත් කරන ලෙසය. එයද අධිකරණයෙන් ලබාගෙන 2024.07.22 වන දින නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත.

2023.03.10 වන දින නඩුව කැඳවා ඇති අතර එදින උපදෙස් ලබා දී ඇත්තේ විත්තිකරුට නොනීසි සඳහා පියවර ගෙන අයදින ලෙසටය. එහෙත් මෙතෙක් නීතිපති දෙපාර්තමේන්තුව පියවර ගෙන නොමැති අතර ඉහත 2024.07.22 දිනැතිව යොමු කළ ලිපියෙන් අනතුරුව ගන්නා පියවර පරීක්ෂා කළ යුතුව ඇත.

03. <u>සේවය අතහැර ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු මුදල</u>

එම්.එම්.එස්.දිසානායක මයා (කාර්යාල කාර්ය සහායක) - රු.128,002.00

මෙම නිලධාරියා විසින් තම ණය ශේෂය ක්‍රමානුකූලව මාසිකව නිරවුල් නොකිරීම හේතුවෙන් ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.5 පරිදි ඇපකරුගෙන් අයකර එවන ලෙස ඇපකරුගේ සේවා ස්ථානයට දන්වන ලදි.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාර
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේඛම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පළමු කොටස : 84.00	
කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු / කාරක සභාව විසින් දෙන ලද නියෝග	කමිටුව විසින් පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කිරීමට / නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ගත් ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය
අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	අභ්‍යන්තර විගණන අංශය මගින් අවදානම් ලේඛනයක් පවත්වාගෙන යන බව කාරුණිකව දන්වමි
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	2022 මූල්‍ය වර්ෂයට අදාළව විගණකාධිපති විසින් යොමු කරන ලද සියළුම විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කර ඇත. විගණන විමසුම් සඳහා පිළිතුරු කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කළද බොහෝ අවස්ථාවලදී විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීමේ දී මාසයකට වඩා කාලයක් ගත වී ඇති බව සඳහන් කරමි. මෙම දෙපාර්තමේන්තුවේ පවතින ව්‍යුහය ඉතා සංකීර්ණ වීම හේතුවෙන් අදාළ අධ්‍යක්ෂ ඒකකය විසින් පිළිතුරු එවීම ප්‍රමාදයට හේතු වන බව නිරීක්ෂණය කරමි. විගණන විමසුම් අදාළ අධ්‍යක්ෂ වෙත ලැබීමේ දී හා විගණන විමසුම් සඳහා ඉංජිනේරු ගිණුම් ශාඛාව වෙත පිළිතුරු නැවත ලැබීමේදී අධ්‍යක්ෂ ඒකකය, නියෝජ්‍ය අධ්‍යක්ෂ ඒකකය හා අදාළ උප ආයතනවල අධීක්ෂණ නිලධාරීන් හරහා යොමු විය යුතු වේ. තවද, මෙම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය අනුව විගණන විමසුම් මඟින් ලබා දෙන නිර්දේශ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී යම් කාලයක් ගතවීම සහ වඩා සාධනීය හා සාර්ථක පිළිතුරක් ලබා ගැනීමට නම් ඉහත සඳහන් අංශ හරහා එම අධීක්ෂණ නිලධාරීන්ගේ නිර්දේශ සමඟ පිළිතුරු ලබා ගැනීම වඩා සාර්ථක වේ. එබැවින්, විගණන විමසුම් සඳහා සම්පූර්ණ පිළිතුරක් ලබා ගැනීමට සමහර අවස්ථාවලදී මාසයකට වඩා වැඩි කාලයක් ගත වන බව සඳහන් කරමි. කෙසේ වෙතත්, විගණන විමසුම්වලට කඩිනමින් පිළිතුරු ඉදිරිපත් කිරීම සඳහා කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාලගේ අංක කෘදෙ/මු/8/6/ර.ගි.කා.ස. හා 2024.07.30 දිනැති ලිපිය මඟින් සියළුම අධ්‍යක්ෂවරු වෙත උපදෙස් ලබා දී ඇත.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරි
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"

අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	අභ්‍යන්තර විගණන විමසුම් වාර්තා ඉදිරිපත් කල පසු එම වාර්තා සඳහා සම්පූර්ණ පිළිතුරක් මාසයක් තුල ලබාගැනීමට අපහසු අවස්ථාවලදී තාවකාලික පිළිතුරක් හෝ මාසයක් තුල ඉගන්වා ගැනීමට හැකි සෑම අවස්ථාවකදීම කටයුතුකර ඇති බව දන්වන අතර 2022 වර්ෂයට අදාලව නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන විමසුම් වාර්තා සඳහා සම්පූර්ණ පිළිතුරු ලැබී ඇති බවද කාරුණිකව දන්වමි. විගණන විමසුම් වාර්තා සඳහා පිළිතුරු ලැබීම ප්‍රමාදවීමට හේතුවන්නේ දෙපාර්තමේන්තුවේ ව්‍යුහය ඉතා සංකීර්ණ වීම නිසා අදාල වාර්තා යොමු වියයුතු අය වෙත ලැබීමේදී හා පිළිතුරු නැවත අභ්‍යන්තර විගණන අංශය වෙත ලැබීමේදී අධ්‍යක්ෂ ඒකකය,නියෝජ්‍ය අධ්‍යක්ෂ ඒකකය හා අදාල උප ආගතනවල අධීක්ෂණ නිලධාරීන් හරහා යොමුවිය යුතු නිසා බව නිරීක්ෂණය කරමි. තවද දෙපාර්තමේන්තුවේ කාර්යභාරය අනුව අභ්‍යන්තර විගණන විමසුම් වාර්තා මගින් ලබාදෙන නිර්දේශ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී යම් කාලයක් ගතවීම සහ වඩා සාධනීය සහ සාර්ථක පිළිතුරක් ලබාගැනීමට නම් ඉහත සඳහන් අංශ හරහා එම අධීක්ෂණ නිලධාරීන්ගේ නිර්දේශ සමග පිළිතුරු ලබාගැනීම වඩා සාර්ථක බව සඳහන් කරන අතර එබැවින් විගණන විමසුම් වාර්තා සඳහා සම්පූර්ණ පිළිතුරක් ලබාගැනීමට සමහර අවස්ථාවලදී මාසයකට වඩා වැඩි කාලයක් ගතවන බවද සඳහන් කරමි.
සියලු වාහන වල අයිතිය තහවුරු කරන ලිපි සත්‍යකයේ නොමැත.	කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ උප ඒකක 05 ක වාහනවල අයිතිය තහවුරු කෙරෙන ලේඛන පවතින අතර සෙසු ඒකකවල වාහන සුළු සංඛ්‍යාවකගේ ලියාපදිංචි සහතිකවල අනු පිටපත් ලබාගත යුතු වේ. ඒ පිළිබඳ ලිපි මගින් අදාල ඒකකයන් දැනුවත් කර ඇත. • ප්‍රධාන කාර්යාලය වෙත යොමු කර ඇති ලියාපදිංචි සහතිකවල තොරතුරු වාහන දත්ත පද්ධතියට ඇතුළත් කිරීමට කටයුතු කර ඇති අතර, එම දත්ත පද්ධතිය ප්‍රකාරව පහත තොරතුරු හඳුනාගෙන ඇත.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේඛම
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

අනු අංක	උප ඒකකය	අයිතිය භාරගැනීම සඳහා ලියාපදිංචි සහතිකවල අනු පිටපත් ලබාගත යුතු වාහන ප්‍රමාණය
01	පාලන අංශය	සියලුම වාහන සඳහා ලියාපදිංචි සහතික පවතී
02	මූදල් අංශය	
03	ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකය	
04	සමාජ ආර්ථික හා සැළසුම් මධ්‍යස්ථානය	
05	ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය	
06	ඉංජිනේරු අංශය	02
07	ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය	05
08	වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය	11
09	ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය	18
10	පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය	11
11	උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය	04
12	බීජ සහතික කිරීම හා දැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය	04
13	ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය	46
14	බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය	43

සියලු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ උප ඒකක 07 ක සියලුම සංචිත වාහනවල රාජ්‍ය ලාංඡනය මුද්‍රණය කර අවසන්ව ඇති අතර අනෙකුත් උප ඒකකවල රාජ්‍ය ලාංඡනය මුද්‍රණය කරන ලෙස ලිපි මගින් දැනුවත් කර ඇත.

අනු අංක	උප ඒකකය	රාජ්‍ය ලාංඡනය මුද්‍රණය කිරීම
01	පාලන අංශය	සියලුම සංචිත වාහනවල රාජ්‍ය ලාංඡනය මුද්‍රණය කර ඇත.
02	මූදල් අංශය	
03	පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය	
04	උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය	
05	ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය	
06	ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය	
07	සමාජ ආර්ථික හා සැළසුම් මධ්‍යස්ථානය	සියලුම සංචිත වාහනවල රාජ්‍ය ලාංඡනය මුද්‍රණය කිරීමට කටයුතු කර ඇත.
08	බීජ සහතික කිරීම හා දැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය	වාහන 17 ක රාජ්‍ය ලාංඡනය මුද්‍රණය කිරීමට ඇත.

ඒල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල

	පහත සඳහන් උප ඒකකවලට අයත් සංචිත වාහනවල රාජ්‍ය මුද්‍රණය කිරීම සම්බන්ධයෙන් 2024.07.25 දිනැති ලිපිය මගින් නැවත විමසීම් සිදුකර ඇත. i. බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය ii. ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය iii. ඉංජිනේරු අංශය iv. බීජ සහතික කිරීම හා පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය v. ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය vi. මුදල් අංශය vii. වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය
වාහනයක් ගර්හිත වී මාස 8 කට වඩා අඩු කාලයකදි අපහරණය කර නොතිබුණි.	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතු අපහරණයට සුදුසු අබලි වාහන වත්කම් කළමනාකරණ ශාඛාව වෙත වාර්ථාවනුයේ අදාල වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වලට නතුව ඒ අනුව පොදු 47 ආකෘතියට ඇතුලත්වය. ඒ අනුව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හපරිච්ඡේද 11.1 මු.රෙ.756 (6) අනුව අවසන් වනුයේ අදාල වර්ෂයේ මාර්තු මාසයේ 15 වන දිනටය. ඉන් අනතුරුව අපහරණය සඳහා ඉදිරිපත් කරන ලද වාහන ලැයිස්තු ගත කොට වර්ගීකරණය සිදු කොට එකී වාහන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතු වාහනද, එවායේ ලියාපදිංචි සහතික තිබේද යන්න විමසා බැලීම හා අදාළ වාහන ලැයිස්තුව ඉදිරිපත් කර අපහරණයට සුදුසු වාහන ලැයිස්තුව ලබා ගැනීම සිදු කරනු ඇත. ඉක්බිති අපහරණයට සුදුසු එකී වාහන රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 13.2 ඡේදයේ මු.රෙ.770 (4) (ඉ) යටතේ රාජ්‍ය ආයතන වල අබලන් වූ වාහන භාවිතයෙන් ඉවත් කිරීමට අදාල මාර්ගෝපදේශ අනුව වර්ගීකරණය කල යුතු කාණ්ඩ තුන අනුව එකී වාහන හඳුනා ගැනීමට හා තක්සේරු කිරීමට කමිටු පත් කිරීම සිදු කරනු ලබයි. තවද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආයතන 250 ක ප්‍රමාණයක් දිවයින පුරා විසිරී පවතින අතර ඒ අනුව එකී වාහන තක්සේරු කිරීම සඳහා වාහන ප්‍රමාණය අනුව තක්සේරු මණ්ඩල වලට වැඩි කාලයක් ගත වනු ඇති අතර ඉන් අනතුරුව අපහරණය සඳහා හඳුනා ගත් තක්සේරු කරන ලද වාහන ලැයිස්තුව අපහරණයට අනුමැතිය ලබා ගැනීම සඳහා ප්‍රධාන ගණුන් දීමේ නිලධාරි වන කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කරනු ලැබේ. ඒ අනුව එකී අනුමැතිය ලද වහාම උක්ත ඡේදයේ සඳහන් වන කාණ්ඩ තුන අනුව වාහන වර්ගීකරණය සිදු කොට

ඩබ්.එම්.එස්. කුමාරි
ප්‍රධාන මූල්‍ය නිලධාරි
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, [illegible]

	ලැයිස්තු ගත කර ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාල අනෙකුත් ලිපි තාක්ෂණ කමිටු නිර්දේශය මත තක්සේරු වටිනාකම් අනුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කමිටුව වෙත හෝ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කරනු ඇත. ඒ අනුව ප්‍රසම්පාදන කමිටුවේ එකී අනුමැතිය ලද පසු වාහන අපහරණය සඳහා ලංසු කැඳවීම පිලිබඳව පුවත්පත් දැන්වීම පල කරන අතර එහිදී මාස 01 ක පමණ කාලයක් ලබා දෙනු ලබන අතර ඒ අනුව ලංසු කැඳවීම සිදු කර එම ලංසු විවෘත කර වාහන වලට අදාලව ගැණුම්කරුවන් ඉදිරිපත් කල වටිනාකම් ලැයිස්තු ගත කොට නැවත තාක්ෂණ කමිටුවේ නිර්දේශ අනුව ප්‍රසම්පාදන කමිටුව වෙත එම වාහන ලැයිස්තු ඉදිරිපත් කරනු ඇත. ඒ අනුව එකී අනුමැතිය ලද වහාම වාහන ඉවත් කර ගැනීමේ පිලිවෙල අනුව පළමු ගැණුම්කරුට, දෙවන ගැණුම්කරුට හා තුන්වන ගැණුම්කරුට පිලිවෙලින් ලිපි යොමු කර අපහරණ ක්‍රියාවලිය අවසන් කරනු ලැබේ. උක්ත කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමේ දී අදාල වර්ෂයේ අවසානයේ දී පමණ අබලි වාහන අපහරණ ක්‍රියාවලිය අවසන් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන අතර අපහරණ ක්‍රියාවලිය සිදු වන අවස්ථාවේ නොවැලැක්විය හැකි බාධාවක් සිදුවූයේ නම් එම කාලය තව මාසයක් පමණ දීර්ඝ විය හැකිය.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ අයවීමට පවතින, මියගිය නිලධාරීන්ගේන් අයවිය යුතු,විශ්‍රාම ගැන්වූ නිලධාරීන්ගෙන් අයවිය යුතු, විශ්‍රාම වැටුපක් රහිතව විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු, වැඩ තහනම් කර ඇති නිලධාරීන්ගේන් අයවිය යුතු, සේවය හැරගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු, මධ්‍යගත කිරීම යටතේ විවිධ අංශ මඟින් මාරුකර තිබූ නිලධාරීන්ගෙන් අයවිය යුතු හා විදේශ ගතව සේවය හැරගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4 හා 6 වගන්ති පිළිබඳව නිරන්තරව අවධානය යොමු කරමින් ඊට අනුකූලව කටයුතු කරනු ලබයි. ඒ අනුව කටයුතු කරමින්, 2022.12.31 දිනට වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන නිලධාරීන් 80 දෙනාට අදාල රු. 4,139,802.23 න් නිලධාරීන් 34 දෙනෙකුගේ ණය ශේෂ එකතුව වූ රු. 1,679,658.58 ක් 2024.07.31 දින වන විට අයකර ගැනීමට කටයුතු කරන ලදි. තව දුරටත් අයකර ගැනීමට පවතින නිලධාරීන් 46 දෙනාට අදාල රු. 2,460,143.65 ක ණය මුළු ණය ශේෂය අයකර ගැනීමට සඳහා මේ වන විට පහත ක්‍රියාමාර්ග ගෙන ඇත.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.ප්‍ර. දිසානායක
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

	වර්ගය	නිලධාරීන් ගණන	ගෙන ඇති ක්‍රියාමාර්ග හා වර්තමාන තත්වය
1	මියගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ (11)	02	• මරණ පාරිතෝෂිකය උරුමකරුවන් වෙත ගෙවා ඇති නමුත් ප්‍රතිපාදන මේ දක්වා නිදහස් කර නොමැත. ප්‍රතිපාදන නිදහස් කල පසු අයවීම් අයකරගත හැක.
		02	• වාරික වශයෙන් අයවේ.
		02	• රාජ්‍ය මුදල් චක්‍රලේඛ 1/2024 අනුව කපා හැරීමට යොමු කිරීම සඳහා වාර්තා සකස් කරමින් පවතී.
		01	• ලිපි ගොනුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යොමු කර ඇත.
		04	• ලිපි ගොනු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යොමු කිරීම සඳහා ගොනුවේ කටයුතු සිදු කරමින් පවතී.
2	විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ (05)	01	• ලිපි ගොනුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යොමු කර ඇත.
		03	• ලිපි ගොනු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යොමු කිරීම සඳහා ගොනුවේ කටයුතු සිදු කරමින් පවතී.
		01	• මු.රෙ. පරීක්ෂණයක් සිදුවෙමින් පවතී.
3	විශ්‍රාම වැටුපක් රහිත නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ (02)	02	• සේවා කාලය ප්‍රමාණවත් නොවීම නිසා පාරිතෝෂිතයක් හිමි නොවන බැවින් හා ණය අයකර ගැනීම සඳහා උත්සාහ දරා ඇතත් ණයකරු විසින් ණය නොගෙවීම නිසා රාජ්‍ය මුදල් චක්‍රලේඛ 1/2024 අනුව කපා හැරීමට

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාර්
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල

			යොමු කිරීම සඳහා වාර්තා සකස් කරමින් පවතී.
4	වැඩ තහනම් කළ නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ - (01)	01	• තවදුරටත් අයකරගැනීමේ හැකියාවක් නොමැති බැවින් රාජ්‍ය මුදල් චක්‍රලේඛ 1/2024 අනුව කපා හැරීමට අදාලව වාර්තා සකස් කරමින් පවතී.
5	සේවය හැරගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ - (21)	03 01 02 09 03 03	• ණය ශේෂයන් වාරික වශයෙන් අයවෙමින් පවතී. • ණය ශේෂය සඳහා මේ වන විට නඩු පවරා ඇත. • කපා හැරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් මහින්ද නිර්දේශ කර ඇති අතර නීතිපති විසින්ද උපදෙස් ලැබී ඇත. ඒ අනුව රාජ්‍ය මුදල් චක්‍රලේඛ 1/2024 අනුව කපා හැරීමට අදාලව වාර්තා සකස් කරමින් පවතී. • කපා හැරීමට නීතිපති උපදෙස් ලැබී ඇත. ඒ අනුව රාජ්‍ය මුදල් චක්‍රලේඛ 1/2024 අනුව කපා හැරීමට අදාලව වාර්තා සකස් කරමින් පවතී. • නීතිපති උපදෙස් සඳහා යොමු කර ඇත. • ණය අයකර ගැනීම සඳහා උත්සාහ දරා ඇතත් ණයකරු විසින් ණය නොගෙවීම නිසා රාජ්‍ය මුදල් චක්‍රලේඛ 1/2024 අනුව කපා හැරීමට යොමු කිරීම සඳහා වාර්තා සකස් කරමින් පවතී.
6	වැටුප් සහිත විදේශගත නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ (03)	02 01	• ණය අයකර ගැනීම සඳහා උත්සාහ දරා ඇතත් ණයකරු විසින් ණය නොගෙවීම් නිසා රාජ්‍ය මුදල් චක්‍රලේඛ 1/2024 අනුව කපා හැරීමට යොමු කිරීම සඳහා වාර්තා සකස් කරමින් පවතී. • නිලධාරියාගේ ඇප කැමිපතු මඟින් හිඟ ණය ශේෂය අයකර ගැනීම සඳහා කටයුතු කරමින් ඇත.

ඒල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාර
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර,

7	මධ්‍යගත කිරීම යටතේ මාරු කළ නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ (03)	01 01 01 **46**	• ණය අයකර ගැනීම සඳහා උත්සාහ දරා ඇතත් ණයකරු විසින් ණය නොගෙවීම නිසා රාජ්‍ය මුදල් චක්‍රලේඛ 1/2024 අනුව කපා හැරීමට යොමු කිරීම සඳහා වාර්තා සකස් කරමින් පවතී. • ණයකරු සුනාමි ව්‍යසනයෙන් මියගොස් ඇති බැවින් රාජ්‍ය මුදල් චක්‍රලේඛ 1/2024 අනුව කපා හැරීමට යොමු කිරීම සඳහා වාර්තා සකස් කරමින් පවතී. • නිලධාරියාගේ ඇප තැම්පතු මඟින් අයකර ගැනීම සඳහා කටයුතු කරමින් ඇත. නිවැරදි පදිංචිය තහවුරු කර ගැනීම සඳහා මැතිවරණ කොමිසන් සභාව වෙත ලිපි යොමු කර ඇත.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැව්ලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල

මු.රෙ. 371 හි වන සීමාව ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.	කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මු.රෙ. 371 හි වන සීමාව ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර නොමැත. නමුත් 2022 මුදල් වර්ෂයේ මාර්ගගත තොරතුරු පද්ධතියට දත්ත ඇතුලත් කිරීමේදී, "මු.රෙ. 371 හි වන සීමාව ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර නොතිබුණේද?" යන ප්‍රශ්නය සඳහා වැරදීමකින් "නැත" ලෙස පිළිතුරු ඇතුලත් කර ඇත. එය නිවැරදි විය යුතු අතර, පිළිතුර විය යුත්තේ "ඔව්" ලෙසය.
අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන ඇත්තේ.	කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවාගෙන නොමැත. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් 2020 වර්ෂයේ බදවාගත් අභ්‍යාසලාභී උපාධිධාරීන් සංවර්ධන නිලධාරී අනුමත සේවක සංඛ්‍යාව නොසලකා මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්ත කිරීම නිසා එම තනතුරේ අතිරික්ත සංඛ්‍යාවක් පවතී. එම අතිරික්ත සේවක සංඛ්‍යාව අනුමත කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලිපි යොමු කර ඇති අතර, මේ වන තෙක් අනුමැතිය ලැබී නොමැත.

එම්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාර
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

දෙවන කොටස : 80.00	
සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබාදී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	පාලන 04 ශාඛාව විසින් දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු වලට අදාළ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය හා වෙනත් ආයතන වලින් පවත්වන පුහුණු වැඩසටහන් සම්බන්ධීකරණය කරනු ලබයි. 2022 වර්ෂයේ වාර්ෂික පුහුණු සැලැස්ම අනුව පුහුණු වැඩසටහන් 20 ක් පැවැත්වීමට කටයුතු සංවිධානය කර තිබූ අතර, පුහුණු වැඩසටහන් ඇස්තමේන්තුවේ සඳහන් වී තිබූ හා ඇස්තමේන්තුවේ සඳහන්ව නොතිබූ පුහුණු වැඩසටහන් 24ක් සංවිධානය හා සම්බන්ධීකරණය සිදු වී ඇත.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අභිභාකර මට්ටමේ විය.	2022 මුදල් වර්ෂයට අදාළව ඉදිරිපත් කරන ලද විගණකාධිපතිගේ මතය, යටත්ව මට්ටමමේ පවතී.
සියලු නිලධාරීන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, විශාල මාණ්ඩලික නිලධාරීන් සංඛ්‍යාවකගෙන් හා උප ඒකක 260කින් පමණ සමන්විත වන දෙපාර්තමේන්තුවකි. මෙම මාණ්ඩලික නිලධාරීන් අතුරින් සියළුම අධ්‍යක්ෂවරුන්ගෙන් හා පරිපාලන අංශයේ මාණ්ඩලික නිලධාරීන්ගේ වත්කම් හා බැරකම් ප්‍රකාශ පමණක් පාලන 03 ශාඛාව වෙත ගෙන්වා ගැනීම 2022 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන ලද අතර සෙසු නිලධාරීන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ අදාල අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කල යුතු බව සියළුම නිළධාරීන් දැනුවත් කරන ලදි. එමෙන්ම, අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් වන වත්කම් හා බැරකම් ප්‍රකාශ පිළිබඳ තොරතුරු පාලන 03 ශාඛාව වෙත ඉදිරිපත් කරන ලෙස සියළුම අධ්‍යක්ෂවරු දැනුවත් කර ඇත.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාර
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. විද්‍රමසිංහ
ලේකම
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි.	ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ අනුමත නිලධාරීන් සංඛ්‍යාව 1183ක් වන අතර, නිලධාරීන් 384ක් පමණක් සේවයේ යෙදී සිටීමත් එබැවින් පුරප්පාඩු 799ක් පැවතීමත් හේතුවෙන්, යම් යම් විෂය පථයන් සඳහා විශේෂීකරණය වූ නිලධාරීන් සිටීම සහ වෛද්‍ය හේතු ඉදිරිපත් කරමින් යොමු කර ඇති නිලධාරීන්ගේ පෞද්ගලික ඉල්ලීම් හේතුවෙන්, නිලධාරීන් වසර 5ට වඩා එකම ස්ථානයක සේවයේ යෙදවීමට සිදු වී ඇති බවත් වාර්ෂික ස්ථානමාරු ක්‍රියාත්මක නිරීමේදී වසර 5ට වැඩි සියළු නිලධාරීන් සැලකිල්ලට ගන්නා බවත් කාරුණිකව දන්වා සිටිමි.එමෙන්ම 2021, 2022, 2023 වාර්ෂික ස්ථානමාරු කමිටු තීරණ අනුව, නිලධාරි හිඟය හේතුවෙන් ස්ථාන මාරු කළ නොහැකිව නව නිලධාරී බඳවා ගැනීමේදී ස්ථානමාරු කිරීම සුදුසු බව ස්ථානමාරු මණ්ඩලය තීරණය කර ඇති නිලධාරීන් සම්බන්ධ තොරතුරු නව නිලධාරීන් බඳවාගැනීම්, ස්ථානමාරු කිරීම සඳහා පාලන අංශය වෙත මේ වන විට යොමු කර ඇති බව දන්වමි. ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ නිලධාරීන් සඳහා ස්ථාන මාරු පටිපාටිය තවදුරටත් සංශෝධන සිදුකර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අනුමැතියට යොමුකර ඇති අතර, අනුමැතිය ලැබුණු පසු ඉදිරි කටයුතු සිදු කරන බව දන්වමි. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ, කෘෂිකර්ම උපදේශක(විශේෂ) ශ්‍රේණියේ නිලධාරීන් සඳහා ස්ථානමාරු පටිපාටියක් නොතිබූ අතර මේ වන විට ස්ථානමාරු පටිපාටිය සකස් කර අනුමැතිය සඳහා 2023.06.19 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇති අතර අනුමැතිය ලැබුණු පසු ඉදිරි කටයුතු සිදු කරන බව දන්වමි. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පර්යේෂණ සහකාර (විශේෂ) ශ්‍රේණියේ තනතුර සඳහා අනුමත තනතුරු 25ක් වන අතර දැනට නිලධාරීන් 5 දෙනෙක් පමණක් සේවය කරනු ලබයි. කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XVIII වෙනි පරිච්ඡේදයේ 250(II) අනුව, වාර්ෂික ස්ථානමාරු කමිටු පත් කිරීමට කටයුතු කර නොමැති බව කාරුණිකව සඳහන් කරමි. තාක්ෂණ සේවයේ නිලධාරීන්ගේ හා තාක්ෂණ සහායක සේවා ගණුවල නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු සිදු කර ඇති අතර, පහත කරුණු හේතුවෙන් උපරිම සේවා කාලයක් සම්පූර්ණ කළ සියළුම නිලධාරීන් ස්ථාන මාරු කිරීම ප්‍රායෝගිකව සිදු කිරීමට නොහැකිවී ඇති බව කාරුණිකව දන්වමි.

ඩබ්ලිව්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

- නිලධාරී පුරප්පාඩු පැවැතීම.
- නිලධාරී පුරප්පාඩු පැවැතීම මත සීමිත නිලධාරීන් ප්‍රමාණයකින් ඒ ඒ සේවා ස්ථාන වල දෛනික රාජකාරී බාධාවකින් තොරව උපරිම ධාරිතාවයකින් අඛණ්ඩව පවත්වා ගැනීමට සිදු වීම.
- ඇතැම් දුෂ්කර සේවා ස්ථාන සඳහා අනුප්‍රාප්තිකයන් ලබා දීමට නොහැකි වීම හා එවැනි සේවා ස්ථාන වල ඇතැම් නිලධාරීන් දුෂ්කර සේවා ස්ථාන වලම සේවය කිරීමට කැමැත්ත පළ කර තිබීම.
- ඉතා දුෂ්කර හා දුෂ්කර සේවා ස්ථාන සඳහා ස්ථාන මාරු ඉල්ලීම් ඉදිරිපත් නොවීම හා ඇතැම් ප්‍රියමනාප සේවා ස්ථාන සඳහා නිලධාරී ඉල්ලීම් අධික වීම.
- එක් එක් සේවා ස්ථානයේ කාර්යභාරය හා සේවා අවශ්‍යතාවය සැළකිල්ලට ගැනීම.
- ඒකක ප්‍රධානී/අධ්‍යක්ෂ නිර්දේශ සැළකිල්ලට ගැනීම.
- 2022 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු යෝජනා කෘෂිකර්ම උපදේශක වෘත්තීය සමිති විරෝධතා හේතුවෙන් අවලංගු කිරීම.
- 2023 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු 2022 හා 2023 යන වර්ෂ දෙකම පාදක කර ගනිමින් සිදු කිරීමට සිදු වූ අතර, එහිදී සේවා කාලය වර්ෂ 05 ඉක්මවූ නිලධාරීන් හා ස්ථාන මාරු අයදුම් කළ නිලධාරීන් ප්‍රමාණය අධික විය. එබැවින්, ස්ථාන මාරු අයදුම් කිරීමට සුදුසුකම් ලද නිලධාරීන් සියළුම දෙනා එක් වර්ෂයක් තුළ ස්ථාන මාරු කිරීම ප්‍රායෝගික නොවන බැවින්, වැඩිම සේවා කාලයක් සහිත නිලධාරීන්, අත්‍යවශ්‍යයෙන්ම ස්ථාන මාරු ලබා දිය යුතු හා වෛද්‍ය හේතු මත ස්ථාන මාරු අයදුම් කළ නිලධාරීන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන ලදී.
- තවද, කෘෂිකර්ම උපදේශක නිලධාරීන්ගේ 2022/2023 වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධව කෘෂිකර්ම උපදේශක වෘත්තීය සමිති විසින් ගරු අභියාචනාධිකරණයේ ගොනු කරන ලද අංක CA/WRIT/471/2022 දරණ අයදුම්පත සඳහා ගරු අභියාචනාධිකරණය විසින් ලබා දුන් අතුරු තහනම් නියෝගය මඟින් එම වර්ෂ වල වාර්ෂික ස්ථාන මාරු තාවකාලිකව අත්හිටවන ලද අතර, නඩු කටයුතු 2024.02.02 අවසන් වීම හා 2022/2023 වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධ ඉදිරි කටයුතු සම්බන්ධ උපදෙස්

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාර්
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය".
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල

නීතිපති දෙපාර්තමේන්තුව වෙතින් මෙතෙක් ලැබී නොමැති වීම මත අදාළ ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

- 2022/2023 වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධ නඩු තීන්දුව ලැබීම ප්‍රමාද වීම හා 2024 වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය 2024.01.22 දින ලැබීම හේතුවෙන් 2024 වර්ෂයට අදාළව වාර්ෂික ස්ථාන මාරු සිදු කිරීමට නොහැකි විය.

- මේ වන විට 2025 වර්ෂය සඳහා වූ වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් කැඳවීම් කර ඇති අතර, නියමිත කාල රාමුව තුළ වාර්ෂික ස්ථාන මාරු කටයුතු සිදු කිරීමට කටයුතු කරමින් පවතින බව තවදුරටත් සඳහන් කරමි.

ඒ අනුව, නීතිරීති රෙගුලාසි හා ප්‍රතිපාදන වලට යටත්ව නියමිත ස්ථාන මාරු කාලසටහන අනුව දෙපාර්තමේන්තුව විසින් තාක්ෂණ සේවයේ වාර්ෂික ස්ථාන මාරු නියමිත පරිදි සිදු කළද, දෙපාර්තමේන්තුවේ පාලන විෂයට පරිභාහිර කරුණු හේතුවෙන් 2021 වර්ෂයෙන් පසු මේ වන තුරු කෘෂිකර්ම උපදේශක නිලධාරින්ගේ පමණක් වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක නොවීම මෙලෙස ස්ථාන මාරු නොවූ වර්ෂ 05ට වැඩි සේවා කාලයක් සහිත නිලධාරින් සිටීමට හේතු වී ඇති බව කාරුණිකව පෙන්වා දෙමි.

ඒකාබද්ධ සේවයේ නිලධාරින්ගේ වාර්ෂික ස්ථානමාරු සිදු කරනු ලබන්නේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් වන අතර එකම සේවා ස්ථානයේ වසර 05කට වඩා සේවය කර ඇති නිලධාරීන්ගේ නාම ලේඛනය වාර්ෂිකව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යවනු ලැබේ.

සංවර්ධන නිලධාරි හා කළමනාකරණ සේවා නිලධාරි සඳහා දෙපාර්තමේන්තුවේ වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු පටිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/07/04/13/01/2022 හා 2024.04.01 දිනැති ලිපිය අනුව 2024.03.27 දින සිට අනුමත කර ඇති අතර ඒ අනුව වසර 05 කට වඩා එකම සේවා ස්ථානයක සේවය කර ඇති නිලධාරින් අභ්‍යන්තර ස්ථානමාරු කිරීම සඳහා අයදුම්පත් කැඳවීම සම්බන්ධ කටයුතු සිදු කෙරෙමින් පවති.

දෙපාර්තමේන්තුගත තනතුරු (ගොවිපල් ලිපිකරු, කෘෂි මෙහෙයුම් නිලධාරී, වැඩසටහන් සහකාර, කෘෂි ව්‍යාප්ති සේවා නිලධාරී, බීජ කාර්මික, නේවාසිකාගාර පාලක / පාලිකා) සඳහා වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු පටිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/07/04/13/01/2022 හා 2024.01.22 දිනැති ලිපිය අනුව 2024.01.18 දින සිට අනුමත කර ඇති අතර ඒ අනුව වසර 05 කට වඩා එකම සේවා ස්ථානයක සේවය කර ඇති

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල

	නිලධාරින් අභ්‍යන්තර ස්ථානමාරු කිරීම සඳහා අයදුම්පත් කැඳවා ඇත. තවද, දෙපාර්තමේන්තුගත ප්‍රාථමික ශිල්පීය නොවන, ප්‍රාථමික ශිල්පීය හා අර්ධ ශිල්පීය (PL-01/PL-02 හා PL-03) සේවා කාණ්ඩයන්ට අදාලව 2024 වර්ෂයට අදාලව අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කරන ලදී. නමුත් මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය ආයතනයන්හි පවතින සේවා අවශ්‍යතාවය, ඉහත සඳහන් තනතුරුවල පුරප්පාඩු පැවතීම, අනුප්‍රාප්තිකයන් ගැලපීමේදී ගැටළුකාරී තත්වයන් මතුවීම හා එක් ආයතනයක් තුළ වසර 05 ට වැඩි සේවකයන් සියලුම දෙනා එකවර ස්ථාන මාරු කිරීමෙන් ආයතනික කටයුතු කරගෙන යාමට ගැටළු ඇතිවීම යනාදී කරුණු මත උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද සියලුම නිලධාරින් ස්ථාන මාරු කිරීමේ හැකියාවක් නොතිබූ බව වැඩිදුරටත් දන්වමි.

ඩබ්ලිව්.පී.ඒස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව පළමු කොටස : 84.00	
කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු / කාරක සභාව විසින් දෙන ලද නියෝග	කමිටුව විසින් පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කිරීමට / නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ගත් ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුල පිළිතුරු සපයා නොතිබුණි.	ප්‍රාදේශීය කාර්යාලවලින් තොරතුරු කැඳවීම් කර පිළිතුරු සැකසීම සිදු කරනු ලබන අවස්ථාවන්හිදී ප්‍රමාදවීම් සිදු වන බැවින් එවන් අවස්ථාවන්හිදී පවතින තත්ත්වය පිළිබඳව දැනුම් දී අතුරු පිලිතුරු යොමු කිරීම මෙන්ම අමතර කාලයක් ඉල්ලුම්කර හෝ පිළිතුරු ලබා දීමට කටයුතු කර ඇත. තවද මෙම තත්ත්වයන් අවම කිරීම සඳහා අදාල වාර්තාවන් ඊ මේල් මඟින් ලබා ගැනීම, දත්ත ලබා ගැනීම සඳහා Google Sheet දත්ත පද්ධතිය හඳුන්වාදී ඇත.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	අභ්‍යන්තර විගනන විමසුම් සඳහා පිලිතුරු ඉදිරිපත් කිරීමේදී බොහෝ විට ලබා දුන් කාල සීමාව තුල පිලිතුරු යොමු කරනු ලබයි. එහෙත් පශු විමර්ශණ මධ්‍යස්ථාන වැනි ප්‍රාදේශීය කාර්යාල වලින් තොරතුරු කැඳවීම් කර පිළිතුරු සැකසීම සිදු කරනු ලබනලබන අවස්ථාවන්හිදී ප්‍රමාද වීම් සිදු වන බැවින් එවන් අවස්ථාවන්හිදී පවතින තත්ත්වය පිලිබඳව දැනුම් දී අතුරු පිළිතුරු යොමු කිරීම මෙන්ම අමතර කාලයක් ඉල්ලුම් කර හෝ පිළිතුරු ලබා දීමට කටයුතු කර ඇත. මෙම තත්ත්වයන් අවම කිරීම සඳහා අදාල වාර්තාවන් ඊ මේල් මඟින් ලබා ගැනීම, දත්ත ලබා ගැනීම සඳහා Google Sheet දත්ත පද්ධතිය හඳුන්වාදී ඇත.
සමාලෝචිත වර්ෂය තුල විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි.	2023 වර්ෂයේ පළමු කාර්තුවට අදාල විගණන කමිටු රැස්වීම 2023.03.21 දින පවත්වා ඇත. දෙවන හා තෙවන කාර්තු රැස්වීම 2023.10.03 දින පවත්වා ඇත. ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුරේ ස්ථිර නිලධාරියෙකු නොසිටි බැවින් අදාල රැස්වීම් කටයුතු නියමිත පරිදි පැවැත්වීමට නොහැකි වූ බව කාරුණිකව දන්වම්.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාර
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍
80/5, "ගොවිජන
රජමල්වත්ත

සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	දෙපාර්තමේන්තුව සතු සියළුම වාහනවල රාජ්‍ය ලාංඡනය ප්‍රදර්ශනය කිරීම මේ වන විට සිදු කර ඇත.
වාහනයක් ගර්හිත වී මාස 8 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	2023 වර්ෂයට අදාලව අපහරණය කිරීමට නියමිත වාහන සම්බන්ධයෙන් රා.මු. වක්‍රලේඛ 02/2015 අනුව කටයුතු සිදු කරමින් පවතින බව කාරුණිකව දන්වමි.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන නිහ ණය ශේෂ පැවතුණි.	i. **ඩී.එස්.පී.** අමරසේන මිය - මෙම නිලධාරිණිය අසනීප තත්ත්වයක් හේතුවෙන් සේවයට වාර්තා නොකරන අතර එම අසනීප තත්ත්වය නිසා වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැන්වීම සඳහා අවශය කටයුතු සිදු කරමින් පවතී. ii. **ඩී.එම්.එස්.බී.** දිසානායක මයා - මෙම නිලධාරියා 2023 දෙසැම්බර් මාසයේ සේවය අත හැර ගොස් ඇති අතර ණය ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බව දන්වා සිටිමි. තවද මෙම නිලධාරීන් වසර 10 කට වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන් බැවින් ඇපකරුවන් නොමැතිව ණය මුදල් ලබා දී ඇති බවත් දන්වා සිටිමි
රැස්කර තිබුනු ආදායම්, සෘජුවම ආදායමට බැර කර හෝ ඒවා තැන්පත් ගිණුමේ රඳවාගෙන මාසයකට වඩා අඩු කාලයක් ඇතුළත ආදායම් ගිණුමට බැර කර හෝ නොතිබුණි.	සේවා ලාභීන් විසින් සෘජුවම තැන්පත් කර තිබූ මුදල් තැන්පත් ගිණුමේ රඳවා තබාගෙන පසුව ඒවා හඳුනාගෙන ආදායමට ගෙන ඇත.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාර්
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

දෙවන කොටස : 71.00	
ආයතනයේ පුරවැසි / සේවා ලාභී ප්‍රඥාප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	ආයතනයේ පුරවැසි / පුරවැසි සේවා ප්‍රඥාප්තිය සකස් කර මේ වන විට දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පල කිරීමට කටයුතු කර ඇති අතර ආයතනයේ පුරවැසි / පුරවැසි සේවා ප්‍රඥාප්තිය ප්‍රදර්ශනය කිරීමට නියමිතය. ඒ අනුව ඒ පිළිබඳව අධීක්ෂණයට සෑම අංශයකම අධ්‍යක්ෂවරයා නියෝජනය වන පරිදි කමිටුවක් පත් කර ඇත.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අහිතකර මට්ටමේ විය.	2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය අනුව විගණන මතය තත්ත්වාගණනය කළ මතයක් වන අතර මතය ව්‍යාවනය කර හෝ අහිතකර මට්ටමේ මතයක් ඉදිරිපත් කර නොමැත.
සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුවේ 2023.06.30 දින වන විට වත්කම් බැරකම් ප්‍රකාශ ලබා ගත යුතු නිලධාරීන් ප්‍රමාණය 149 ක් වන අතර නිලධාරීන් 102 ක් මේ වන විට වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇත. වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකළ නිලධාරීන්ට වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කරන ලෙස දන්වා ඇත.
උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි.	දෙපාර්තමේන්තුවේ වර්ෂ 06 ක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරීන් පිළිබඳ තොරතුරු මාරු මණ්ඩල වෙත ඉදිරිපත් කර ඇත. ඉන් සේවා අවශ්‍යතාවය මත ස්ථාන මාරුවීම් නොකරන ලෙස මාරු මණ්ඩල වෙත ඉල්ලීම් නොකළ නිලධාරීන් හැර අනෙකුත් සියළුම කාර්ය මණ්ඩල වාර්ෂික ස්ථාන මාරු කිරීමට කටයුතු කර ඇත. එසේ වුවද පහත කරුණු හේතුවෙන් දෙපාර්තමේන්තුවේ වසර 06 ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සියලු නිලධාරීන් ක්‍රමවත් ලෙස ස්ථාන මාරු සිදු කිරීම අපහසු වී ඇත. • ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු අනුප්‍රාප්තිකයෙකු නොමැතිවීම. (මෙම දෙපාර්තමේන්තුව තාක්ෂණික දෙපාර්තමේන්තුවක් වන බැවින්) • එවකට ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ රසායනාගාර සහායක තනතුර සඳහා සහ දෙපාර්තමේන්තුවේ රියදුරන් සඳහා අභ්‍යන්තර ස්ථානමාරු පටිපාටියක් අනුමත කරගෙන නොතිබීම (මේ වන විට වාර්ෂික ස්ථානමාරු පටිපාටිය කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම් මහින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අනුමැතියට යවා ඇත.)

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග
80/5; "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර,

	• වාර්ෂික ස්ථානමාරු අවස්ථාවන්හිදී ස්ථාන මාරු කිරීම සඳහා ගැලපීමට අදාල සේවා ස්ථානය ඉල්ලුම් කරන ලද නිලධාරීන් නොමැති වීම. • ස්ථානමාරු පටිපාටිය යටතේ වාර්ෂික ස්ථානමාරු සඳහා ආසන්නම සේවා ස්ථානය වෙත ස්ථාන මාරු කිරීමට යටත් වන අතර ආසන්නම සේවා ස්ථානයේ අනුමත තනතුරු සේවක සංඛ්‍යාව මත පමණක් ස්ථාන මාරු ලබාදීමට සිදු වීම.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව පළමු කොටස : 86.00	
කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු / කාරක සභාව විසින් දෙන ලද නියෝග	කම්ටුව විසින් පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කිරීමට / නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ගෘහ ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	"සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි" යන කරුණ හා එකඟ විය නොහැක. විගණන විමසුම් 5 ක් හැර අනෙකුත් සියළු විගණන විමසුම් සඳහා මසකට වඩා අඩු කාලයකදී පිළිතුරු සපයා ඇත. නිලධාරීන් දැනුවත් කර පිළිතුරු මසක් තුළ යැවීමට කටයුතු කර ඇත.
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අඩුරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	භාණ්ඩ සමීක්ෂණ ආයතන හා කාර්යාල විශාල සංඛ්‍යාවක් සිදුකළ යුතු බැවින් නිලධාරීන් යොදා ගැනීමේ අපහසුතාවය මත නියමිත කාලය තුළදීම සියලුම කාර්යයන් සිදු කළ නොහැකි වුවද 2022.6.30 දිනට පෙර සියළු කාර්යයන් අවසන් කර ඇත. නියමිත කාලය තුළදීම ඉටුකිරීමට අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත.
සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	සියළු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත. ඉහත කාරණය හා එකඟ නොවෙමි. මෙම දෙපාර්තමේන්තුව සතුව ඇති වාහනවල අයිතිය තහවුරු කරන ලිපි (වාහන වල පොත්) පාලන අංශය සතුව පවතින බව සඳහන් කරමි.
මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම්වලට එළඹ තිබුණි.	මු.රෙ 94(1) අනුව ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම් ඇති කර නොගන්නා ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දීමට කටයුතු කර ඇත.

ඩබ්ලිව්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

වාර්ෂික කාර්යසාධන වාර්තාව නිසි පරිදි පාර්මේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා කටයුතු ආරම්භ කර නොතිබුණි.	2022 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව සකස් කිරීම සඳහා තොරතුරු රැස් කිරීමේදී නියමිත දිනට වාර්තාව පාර්ලිමේන්තුව වෙත කඩිනමින් ඉදිරිපත් කිරීමට අවශ්‍ය බව සඳහන් කරමින් අංක RDD/04/04/කා.සා.වා./2022/1 හා 2023.05.17 දිනැති ලිපිය මඟින් රජයේ විගණන අංශයේ විගණන අධිකාරි වෙතින් විගණකාධිපති වාර්තාව ඉල්ලුම් කර ඇත. එසේ වුවද, 2023 වර්ෂයට අදාළ විගණකාධිපති වාර්තාව ද 2024.05.30 වන දින දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති බැවින් 2023 වසරේ ද කාර්ය සාධන වාර්තාව ද 2024.05.31 දිනට ප්‍රථම පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ නොහැකි විය. එබැවින් 2024 වසරේ විගණකාධිපති වාර්තාව 2025.03.31 දින වනවිට දෙපාර්තමේන්තුව වෙත ලැබීමට සලස්වන ලෙස දන්වා රජයේ විගණන අධිකාරි වෙත ලිපියක් යොමු කිරීමට කටයුතු කරන බව වැඩදුරටත් කාරුණිකව දන්වමි.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරි
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

දෙවන කොටස : 99.00	
සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබාදී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබුණු අවස්ථා ප්‍රමාණය 50% වඩා අඩු මට්ටමක පැවතීමට හේතුව වූයේ 2022 වර්ෂයේ පළමු මාස 6 තුළ කොරෝනා වසංගත තත්ත්වය මත පිරියක් ඒකරාශී කිරීමට සෞඛ්‍ය කොන්දේසි පනවා තිබූ බැවින්, පුහුණු වැඩසටහන් පැවැත්වීමට හැකියාවක් නොතිබීම මත සැලසුම් කර තිබූ පුහුණු වැඩසටහන් නොපැවැත්වීමයි.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාර
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පළමු කොටස : 90.00	
කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු / කාරක සභාව විසින් දෙන ලද නියෝග	කම්ටුව විසින් පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කිරීමට / නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ගත් ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය
2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ණිණුම් චක්‍රලේඛය ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ මුරපද තුන් මසකට වරක් වෙනස් කර නොතිබුණි.	දෙපාර්තමේන්තුවේ වැටුප් සකස් කිරීමේ මෘදුකාංගය වන Pay Roll මෘදුකාංගයේ මුර පදය මේ වන විට 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව නිසි පරිදි තුන් මසකට වරක් වෙනස් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	2022 වර්ෂයට අදාළව විගණකාධිපති විමසුම් 19 ක් ලැබී ඇත. එයින් විමසුම් 08 ක් සඳහා මාස 03 ක් ඇතුලත පිළිතුරු සැපයීම සිදු කර ඇත. ප්‍රධාන කාර්යාලය මඟින් දෙපාර්තමේන්තුවේ විවිධ ආයතන වෙතින් පිළිතුරු කැඳවා රජයේ විගණනය වෙත පිළිතුරු සැපයීම සිදු කරන අතර ඒ හේතුවෙන් ප්‍රමාද වීම් සිදු වී ඇත. මින් ඉදිරියට මසක කාලයක් තුල පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2022 මුදල් වර්ෂයට අදාළ සියලුම මාසික ධාවන සටහන් හා සාරාංශ වාර්තා අභ්‍යන්තර විගණන අංශය වෙත භාරදී ඇත. අභ්‍යන්තර විගණන අංශය මගින් 2022.10.11, 2023.02.08, 2023.05.03, 2023.07.19 සහ 2023.12.27 යන දිනයන් වල රජයේ විගණනය වෙත ඉදිරිපත් කර ඇත.
සියලු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	මේ වන විට සියලු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර ඇත.

ඩබ්ලිව්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

වාහනයක් ගර්හිත වී මාස 8 ට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබීණ.	රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය මත ගර්හිත වී තිබූ වාහන අපහරණ ක්‍රියාවලිය අවසන් කිරීමට නොහැකි වූ බව සඳහන් කරන අතර, මේ වන විට එම අපහරණ ක්‍රියාවලියේ විකුණුම් මිල තක්සේරු කමිටුව පත් කර ඊට අදාළ කටයුතු කරමින් පවතී.
බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනයට පිළියෙල කර සහතික කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.	බැංකු ලැබීම් රිසිට්පත් නිවැරදිව හඳුනාගත් පසු ඒවා උපලබ්ධි කළ යුතු බැවින් දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ කාර්යාල වලින් ප්‍රමාද වී රිසිට්පත් ලැබීම නිසා නිසි වේලාවට බැංකු සැසඳුම ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත. තවද අපනයන කෘෂි බෝග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මෙම ගිණුමට අදාළව දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ කාර්යාල හරහා ප්‍රතිලාභීන් විසින් සෘජුවම බැංකු ගිණුමට මුදල් බැර කෙරේ. එසේ බැර කරන තැන්පතු පිළිබඳ තැන්පතු පත්‍රිකා සහකාර අධ්‍යක්ෂ කාර්යාල මඟින් ප්‍රධාන කාර්යාලයට එවනු ලබන අතර, ඉන්පසු එම රිසිට් සඳහා සරප් මඟින් ලැබීම් රිසිට්පත් නිකුත් කෙරේ. මෙසේ තැන්පතු පත්‍රිකා ප්‍රධාන කාර්යාලයට එවීමේදී හා ඒවා නිසි පරිදි හඳුනා ගැනීමෙන් පසු ආදායම්ගත කිරීමේදී, ඇතිවන ප්‍රමාදය හේතුවෙන් මෙසේ බැංකු සැසඳුම් සකස් කිරීමේ ප්‍රමාදයන් සිදු වී ඇත. ඉදිරියේදී එය නිවැරදි කර ගැනීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාර
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.ජී. [illegible]
ලේකම
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

දෙවන කොටස : 83.00	
2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	නව කොරෝනා වසංගතය හේතු කොට ගෙන දිවයින පුරා පොලිස් ඇදිරි නීතිය ප්‍රකාශ කර තිබූ අතර සියළුම රාජ්‍ය සේවකයින් සිය නිවෙස් වලට වී සිය රාජකාරිකටයුතු වල නියැලෙන ලෙස ජනාධිපති කාර්යාලය මඟින් 2020.03.26 වන දින නිකුත් කරන ලද චක්‍ර ලේඛ අංක පීඑස්/සීඑස්ඒ/චක්‍ර ලේඛ /17/2020 සඳහන් කර තිබූ බැවින් රජයේ කාර්යාල වල කටයුතු සීමා කිරීමට සිදු වූ අතර මාණ්ඩලික නිලධාරීන් හා අත්‍යාවශ්‍ය සහායක නිලධාරීන් පමණක් කාර්යාලය වෙත වාර්තා කරන ලදි. ඒ හේතුවෙන් 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ විධාන අනුව 2022 අදාලව මානව සම්පත් සංවර්ධන සැලැස්ම නිසි ලෙස සකස් කිරීමට නොහැකි විය. මේ වන විට එම සැලැස්ම සකස් කර ඇති අතර අදාළ පුහුණු කටයුතු සිදු කරමින් පවතී.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් 50% ට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 ට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	ස්වදේශ කටයුතු චක්‍ර ලේඛ : 10/2020 අනුව විශාල වශයෙන් රාජ්‍ය නිලධාරීන් හා මහජනතාව එක් රැස් වන පුහුණු වැඩසටහන්, රැස්වීම් තාවකාලිකව අත්හිටුවිය යුතු බව සඳහන් කර තිබුණු බැවින් සහ රා.ප.ව.ලේ. 07/2022,08/2022,09/2022,10/2022,13/2022, 15/2022, 16/2022 හි උපදෙස් අනුව දැඩි සීමා කිරීම් මධ්‍යයේ නිලධාරීන් සඳහා 2022 වර්ෂයට සැලසුම් කල පුහුණු අවස්ථාවන් ලබා දීමට නොහැකි විය. 2023 වර්ෂයට අදාළ මානව සම්පත් සංවර්ධන සැලැස්මට නිසි පරිදි සකස් කර ක්‍රියාත්මක කරමින් පවතී.
සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුලත්ව කාර්ය සාධන ගිවිසුම සකස් කර ගිවිසුම් ගතව නොතිබිණි.	නව කොරෝනා වසංගතය හේතු කොට ගෙන දිවයින පුරා පොලිස් ඇදිරි නීතිය ප්‍රකාශ කර තිබූ අතර සියළුම රාජ්‍ය සේවකයින් සිය නිවෙස් වලට වී සිය රාජකාරිකටයුතු වල නියැලෙන ලෙස ජනාධිපති කාර්යාලය මඟින් 2020.03.26 වන දින නිකුත් කරන ලද චක්‍ර ලේඛ අංක පීඑස්/සීඑස්ඒ/චක්‍ර ලේඛ /17/2020 සඳහන් කර තිබූ බැවින් රජයේ කාර්යාල වල කටයුතු සීමා කිරීමට සිදු වූ අතර මාණ්ඩලික නිලධාරීන් හා අත්‍යාවශ්‍ය සහායක නිලධාරීන් පමණක් කාර්යාලය වෙත වාර්තා කරන ලදි. ඒ හේතුවෙන් 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ විධාන අනුව 2022 අදාළව මානව සම්පත් සංවර්ධන සැලැස්ම නිසි ලෙස සකස් කිරීමට නොහැකි වූ අතර සමස්ත කාර්ය මණ්ඩලය අදාළ කාර්ය සාධන ගිවිසුම් වලට එළඹිය නොහැකි විය.
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	ස්වදේශ කටයුතු චක්‍ර ලේඛ : 10/2020 අනුව විශාල වශයෙන් රාජ්‍ය නිලධාරීන් හා මහජනතාව එක් රැස් වන පුහුණු වැඩසටහන්, රැස්වීම් තාවකාලිකව අත්හිටුවිය යුතු බව සඳහන් කර තිබුණු බැවින් සහ රා.ප.ව.ලේ. 07/2022,08/2022,09/2022,10/2022,13/2022, 15/2022, 16/2022 හි උපදෙස් අනුව දැඩි සීමා කිරීම් මධ්‍යයේ නිලධාරීන් සඳහා 2022 වර්ෂයට සැලසුම් කල (කාර්යක්ෂමතා කඩයිම් වලට අදාළ පුහුණු කිරීම්) පුහුණු

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. චිත්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අභිතකර මට්ටමේ විය.	මෙම වර්ෂයට අදාළව ආයතනයේ ගිණුම් පිළිබඳ තත්ත්වාගණනය කළ මතයක් ඉදිරිපත් කර ඇත.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව පළමු කොටස : 77.00	
කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු / කාරක සභාව විසින් දෙන ලද නියෝග	**කම්ටුව විසින් පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කිරීමට / නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ගත් ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය**
2022.12.13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශයේ 8.1 හා 8.2 ඡේද ප්‍රකාරව සිගාස් වැඩසටහනේ ස්ථාවර වත්කම් මොඩියුලය යාවත්කාලීනව පවත්වා නැත.	2022.12.13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශයේ 8.1 හා 8.2 ඡේද ප්‍රකාරව සිගාස් වැඩසටහනේ ස්ථාවර වත්කම් මොඩියුලය යාවත්කාලීනව පවත්වාගෙන යනු ලැබේ. ඒ අනුව, ප්‍රධාන කාර්යාලය සහ දිස්ත්‍රික් කාර්යාල 25 සඳහාම අදාළ වක්‍රලේඛ ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යනු ලැබේ.
අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොමැත.	අවදානම් ලේඛනය සකස් කර ඇති අතර, යාවත්කාලීන කිරීම පිළිබඳ ප්‍රායෝගික ගැටළු කිහිපයක් පැන නැඟී ඇත. අදාල ගැටළු විසඳා ගැනීමෙන් අනතුරුව යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ.
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	දිවයින පුරා විසිරී පවතින ගොවිජන සේවා මධ්‍යස්ථාන 562කින් හා දිස්ත්‍රික් කාර්යාල 25 මඟින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මහජනතාවට සේවා සපයනු ලැබේ. දිස්ත්‍රික් කාර්යාල සහ ගොවිජන සේවා මධ්‍යස්ථාන අදාළ දිස්ත්‍රික්කයේ විගණන අධිකාරී මඟින් විගණනය කර විගණන විමසුම් ඉදිරිපත් කරනු ලබයි. මෙයට අමතරව ප්‍රධාන කාර්යාලයේ රජයේ විගණන අංශය මඟින් ද අදාළ දිස්ත්‍රික් කාර්යාල හා ගොවිජන සේවා මධ්‍යස්ථාන විගණනය කර විගණන විමසුම් යොමු කරනු ලැබේ. මෙසේ ඉදිරිපත් කරන සියලු විගණන විමසුම් වෙනුවෙන් අදාළ පැහැදිලි කිරීම් දිස්ත්‍රික් කාර්යාල හා අදාළ ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙතින් ලබාගෙන අවසාන පිළිතුර ගොනු කළ යුතු වේ. සමහර විගණන විමසුම් සඳහා අවශ්‍ය වන පැහැදිලි කිරීම් ලබාගනිමින් අවසාන පිළිතුරු සකස් කිරීම ලබා දී ඇති කාලය තුළ ඉටු කිරීම ප්‍රායෝගිකව කළ නොහැකි අතර, එබැවින් පිළිතුරු සැපයීම ප්‍රමාද වන අවස්ථා දක්නට ලැබුණි. කෙසේ වෙතත් මේ වන විට අවසන් පිළිතුරු ලබා දීමට ප්‍රමාද වී ඇති විගණන විමසුම් සඳහා අදාල පිළිතුරු සකස් කිරීමට විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දී ඇති අතර, එය ක්‍රියාත්මක වන බව දන්වමි. ඒ අනුව, 2024.10.30 දිනට දෙපාර්තමේන්තුව වෙත ලද මුළු විගණන විමසුම් සඳහා අවසන් පිළිතුරු විගණනය වෙත ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය ඇතුළත් සාරාංශය පහත පරිදි වේ.

ඩබ්ලිව්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාර
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

	දෙපාර්තමේන්තුව වෙත ලද විගණන විමසුම්	2024.10.30 දිනට පිළිතුරු ඉදිරිපත් කරන ලද විගණන විමසුම් ගණන	පිළිතුරු ලබා දීමට ඇති විගණන විමසුම් ගණන		
	වර්ෂය	විගණන විමසුම් ගණන		අයවිය යුතු හා ගෙවිය යුතු ශේෂ පිළිබඳ විගණන විමසුම්	වෙනත් විගණන විමසුම්	එකතුව
	2019	129	124	5	0	5
	2020	110	108	2	0	2
	2021	118	117	0	1	1
	2022	219	217	1	1	2
	2023	54	54	0	0	0
	2024	30	26	0	4	4
	මුළු එකතුව	660	646	8	6	14
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ අත්සනින් නිකුත් කරන අභ්‍යන්තර විගණන වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් ගනුලබන ක්‍රියාමාර්ග දින 14 ඇතුලත ඉදිරිපත් කරන ලෙස ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරල්ගේ අත්සනින් දිස්ත්‍රික් භාර නියෝජ්‍ය / සහකාර කොමසාරිස් වරුන් වෙත දන්වා ඇත. මෙම අභ්‍යන්තර විගණන වාර්තාව දිස්ත්‍රික් භාර නියෝජ්‍ය / සහකාර කොමසාරිස් වෙත ලැබීමෙන් පසු වාර්තාවේ අඩංගු කරුණු පිළිබඳ පැහැදිලි කිරීම් ලබා ගැනීම සඳහා එම වාර්තාව අදාල ගොවිජන සේවා මධ්‍යස්ථාන භාර ගොවිජන සංවර්ධන නිලධාරීන් වෙත යොමු කරනු ලැබේ. එම වාර්තාව සඳහා ගොවිජන සංවර්ධන නිලධාරීන් විසින් සකස් කරන පිළිතුරු දිස්ත්‍රික් භාර නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරුන්ගේ නිරීක්ෂණය ඇතුලත් කර ඔවුන්ගේ අත්සනින් පිළිතුරු ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය මාසයකට වැඩි කාලයක් ගතවන බවත්, එම තත්ත්වය වලක්වා ගැනීමට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී හා ප්‍රගති සමාලෝචන රැස්වීම්වලදී අවධානය යොමු කරන බවද දන්වා සිටිමි.	

ඩබ්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාර
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, වැඩිදියුණු සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	සංචිත වාහන සඳහා අදාල දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා එලැබෙන මාසයේ 15 වන දිනට පෙර විගණන අංශය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.
සියලුම වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	දෙපාර්තමේන්තු වාහනවල රාජ්‍ය ලාංඡනය සහිත ස්ටිකර් අලවා තිබූ අතර, කාලයාගේ ඇවෑමෙන් එම ස්ටිකර් දූර්වර්ණ වී මැකී ගොස් ඇත. රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීම සිදු කරනු ලැබේ.
වාහනයක් ගාර්ෂිත වී මාස 08 කට වඩා අඩු කාලයක දී අපහරණය කර නොතිබුණි.	වාහන 13ක් සම්බන්ධයෙන් අපහරණ කටයුතු අවසන් කර ඇති අතර, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාලව කොමසාරිස් ජනරාල් නමට ලියාපදිංචි වී ඇති වාහන 10ක් සම්බන්ධයෙන් ලියාපදිංචි සහතිකවල මුල් පිටපත් නොමැති බැවින් අධිකිය තහවුරු කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් අපහරණ කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇත. ඒ අනුව අදාල වාහනවල මුල් පිටපත් ලබා ගැනීම සඳහා කුරුඳුවත්ත පොලිසිය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව, පැමිණිලි පිටපතක් රැගෙන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර වාහන ලියාපදිංචි සහතිකවල අනුපිටපත් ලබා ගැනීමට කටයුතු සිදු කරනු ඇත. එමෙන්ම ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් නමට ලියාපදිංචි වී නොමැති වාහන 15ක් පවරා ගැනීම සඳහා (දැනට ඈවර කර ඇති ආයතන) 2018.10.10 දිනැති 03/2018 වත්කම් කළමණාකරණ චක්‍රලේඛ අනුව පවරා ගැනීමට කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය මඟින් සිදු කර ගැනීමට හැකි බැවින් එම වාහන 15 සම්බන්ධයෙන් පොලිස් පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත. අදාල උපදෙස් මත ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. ඒ අනුව, අදාල ගැටළු නිරාකරණය කර ගැනීමෙන් අනතුරුව 2024 වර්ෂයේ වාහන අපහරණය කිරීම සඳහා විශේෂ සමීක්ෂණ මණ්ඩලයක් පත් කර විධිමත් සැලැස්මක් සකස් කර ඇත.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාර
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඩෙයි සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"

රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි.	පහත සඳහන් වාහනවල මු:රෙ 103 ,104 ,109 හා 110 ප්‍රකාරව කටයුතු කර ඇත. **53-9816** - මෙම අනතුරට අදාළව පුත්තලම දිසා අධිකරණයෙහි පැවති අංක 2704/එම් දරන නඩුව 2021.02.18 වන දින අවසන් වී ඇති අතර අලාභ වශයෙන් දෙපාර්තමේන්තුව විසින් ගණනය කර ඇති රු.149,750.00 මුදල කුවිතාන්සි අංක A/24 716613 හා 2021.02.16 දිනැතිව පුත්තලම ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය වෙත නඩුවේ වින්නිකරු වන සෙයිනූල් ආබ්දීන් මොහොමඩ් සියාද් යන අය විසින් ගෙවා ඇත. **PB-5280** - මෙම අනතුර වළක්වා ගත නොහැකි රිය අනතුරක් බැවින් අලාභය රථයට සිදු වූ පාඩුවක් ලෙස නිගමනය කර ඇත. එබැවින් මු.රෙ.109 යටතේ අලාභය පොතෙන් කපා හැරීම සඳහා අදාළ ලිය කියවිලි පොහොර අංශයෙන් නිර්දේශ සහිතව ලද පසු, අලාභය පොතෙන් කපා හැරීම සඳහා කටයුතු කරනු ලැබේ. **250-2078** - 2015.11.24 දිනැති ලිපියට අනුව අනුරාධපුර ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය වෙතින් මු.රෙ.104 (3) යටතේ අලාභයන් පිළිබඳ ප්‍රාරම්භන වාර්තාව හා මු.රෙ. 104 (4) යටතේ අලාභයන් පිළිබඳ අවසාන වාර්තාව ලබා දී ඇත. මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා මු.රෙ. 109 යටතේ අලාභය පොතෙන් කපා හැරීම සඳහා වන ලියකියවිලි පොහොර අංශයෙන් නිර්දේශ සහිතව ලද පසු අලාභය පොතෙන් කපා හැරීම සඳහා කටයුතු කරනු ලැබේ. **53-9830** - මේ සම්බන්ධව ජාතිපති දෙපාර්තමේන්තුව මගින් වන්දි නඩුවක් පැවරීමට අවශ්‍ය කටයුතු ඉටුකර දෙන මෙන් ඉල්ලා 7/1/2/32/1 හා 2013.12.12 දින ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් (කුරුණෑගල) විසින් ලිපියක් ඉදිරිපත් කර ඇති අතර, ඒ අනුව කුරුණෑගල දිසා අධිකරණයේ නඩු අංක 15/MD මගින් මෙම අලාභය අයකර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කර ඇත. කුරුණෑගල දිසා අධිකරන නඩු අංක 15 / MD නඩුවේ දෙවන වින්නිකරු වන සීමාසහිත සමුපකාර රක්ෂණ සමාගම විසින් රු.51,750 ගෙවීමට එකඟවී ඇති අතර එම මුදල ලබාගෙන නඩුව අවසන් කිරීමට එකඟතාව ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් පල කර ඇති බැවින් මේ වන විට අදාල නඩුව අවසන්ව ඇත. අනෙකුත් අනතුරු ලිපි ගොනුවල අදාල කටයුතු සිදු කරමින් පවතී.

ඩබ්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම, හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.ගෙ.ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.ගෙ.ප්‍රකාරව නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන නිඟ ණය ශේෂ පැවතුණි.	කල් ඉක්ම වූ ණය ශේෂ අයකර ගැනීම සඳහා අදාල පාර්ශව හා ආයතන දැනුවත් කර ලිපි යොමු කර ඇති අතර, සැලකිය යුතු ණය ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර ඇත. එමෙන්ම මූලාශ්‍ර හඳුනා ගත නොහැකි හෝ කිසිසේත්ම අයකර ගත නොහැකි ණය ශේෂ කපා හැරීම සඳහා මුදල් අමාත්‍යාංශය වෙත ලිපි යොමු කර ඇත.
පොදු තැන්පෑ ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.ගෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	පොදු තැන්පතු ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් අක්මුදල් ලැබීම් අනුව ප්‍රමුඛතා පදනම්න් නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින අතර, අක්මුදල් ලැබීම් අනුව ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.
මු.ගෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	විගණකාධිපති නිර්දේශ අනුව මු.ගෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම නිරවුල් කිරීම පිළිබඳව පාලන ක්‍රමයක් සකස් කර ඇති අතර, කාර්යය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කිරීමට අදාල නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේඛම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

දෙවන කොටස : 36.00	
ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	➢ මෙම දෙපාර්තමේන්තුවේ නිලවෙබ් අඩවිය නිර්මාණය කිරීමේදී එහි සාමාන්‍ය තොරතුරු යාවත්කාලීන කිරීමට පමණක් සැලසුම් කර ඇත. ➢ විගණක විසින් දක්වා ඇති විගණන කරුණු ක්‍රියාත්මක කිරීම සඳහා විශාල මුදලක් හා කාලයක් වැය වන බැවින් ,www.agrariandepat.lk දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පල කරන ලද සබැඳියක් මඟින් www.agrarian.lk වෙබ් අඩවියෙහි විවෘත වන වෙබ් පිටුවක මහජනතාවට තම අදහස් පල කිරීමට පහසුකම් සලසා ඇත. ➢ තවද අල්ලස් හා දූෂණ ක්‍රියාවන් සම්බන්ධව මහජනයාට පැමිණිලි කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ පිවිසුම් ඉදිරිපිට මහජන පැමිණිලි බහාලුමක් තබා ඇත.
2018.01.24 දිනැති අංක 05/2018(1) දරන චක්‍ර ලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ඇති අතර, එය ආයතනයේ ප්‍රදර්ශනය කර ඇත.
ආයතනයේ පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳව අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳව අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කරමින් පවතී.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාර්
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.ඒ. ...
ලේකම
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩ...
80/5, "ගොවි...
රජමල්වත්ත ප...

2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.	මානව සම්පත් සැලැස්ම පිළියෙළ කර ඇත.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50කට වැඩි පිරිසෙහට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාක් සාතිකා කර නොතිබුණි. සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබුණු පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	මෙම දෙපාර්තමේන්තුවේ විමර්ශන අංශය, පුහුණු අංශය හා විනය අංශය යන සියලු අංශ මානව සම්පත් කොමසාරිස් යටතේ ක්‍රියාත්මක විය. එය ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමු ශ්‍රේණියේ තනතුරකි. නමුත් පළමු පන්තියේ නිලධාරියෙකු නොමැති වීම හේතුවෙන් එම කාලය තුළ පරිපාලන සේවයේ තෙවන පන්තියේ නිලධාරියෙකු මඟින් රාජකාරී ආවරණය කරන ලදී. මෙම කාල සීමාව තුළ දිවයින පුරා විසිරී සිටි 13,620ක් පමණ වන කාර්යය මණ්ඩලයේ සියලු ආයතනික කටයුතු එනම්, ➢ කාර්යය මණ්ඩල බඳවා ගැනීම් ➢ උසස් කිරීම් ➢ ස්ථිර කිරීම් ➢ පුරප්පාඩු කාළමනාකරණ කටයුතු ➢ ප්‍රධාන කාර්යාලයේ සේවයේ නියුතු නිලධාරීන්ගේ පුද්ගලික ලිපිගොනු නඩත්තු කිරීමට අදාල කාර්යය මණ්ඩල කටයුතු ආදී කාර්යයන්ට අමතරව දිවයින පුරා සිටින කාර්යය මණ්ඩලයේ විමර්ශන කටයුතු ඉටු කිරීමත් ඒ හා සම්බන්ධ විනය පරීක්ෂණ කටයුතු සිදු කිරීමත් මේ අවධියේ ප්‍රමුඛ කාර්යයක් විය. මෙම විමර්ශන හා විනය පරීක්ෂණ ද පුහුණුවක් ලත් නිලධාරීන් නොමැති වීම හේතුවෙන් ප්‍රමාද වීම සහ සමහර විනය පරීක්ෂණ හා විමර්ශන සඳහා වසර පහකට ආසන්න කාලයක් ගත වීම ද දක්නට ලැබුණි. එම විනය පරීක්ෂණ හා විමර්ශන අවසන් නොවීම මත නිලධාරීන් විශාල ප්‍රමාණයකගේ සේවය ස්ථිර කිරීම හා විශ්‍රාම ගැනීම සම්බන්ධයෙන් ගැටලුවක්ව පැවතිණි.

ඩබ්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
[illegible]ර්වස්ත පටුමග,
[illegible]ත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

	එබැවින් පුහුණු අවස්ථා සඳහා මුදල් වෙන් කරනු ලැබුව ද, පුහුණු අංශයේ වගකීම් විධිමත්ව භාර දීම සඳහා සුදුසුකම් ලත් නිලධාරියෙකු නොමැතිවීම හා කාර්යය මණ්ඩල විශ්‍රාම ගැන්වීම සඳහා සැලකිය යුතු කාලයක් ප්‍රමාද වී තිබූ බැවින් එම රාජකාරී සඳහා සමස්ත මානව සම්පත් සංවර්ධන අංශයේ නිලධාරීන්ගේ උපරිමය යෙදවීමට කටයුතු කරන ලදී. පුහුණු වැඩසටහන් සඳහා ප්‍රමාණවත් කාලයක් හා ධාරිතාවයක් මෙම අංශය තුළ නොමැති වීමෙන් සැලසුම් කළ පරිදි පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය. එසේ වුවද, මේ වන විට පුහුණු අංශයට වෙන් වී ඇති ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් කාර්යය මණ්ඩල පුහුණු අංශය මඟින් විධිමත්ව පුහුණු කටයුතු මෙහෙයවනු ලබන බව දන්වමි.
මානව සම්පත් සංවර්ධනා සැලසුම් සකස් කිරීමට ද, ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	පුහුණු කටයුතු සඳහා වෙනම් අංශයක් අතිරේක කොමසාරිස් ජනරාල්ගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ /ව්‍යාවන මට්ටමේ /අහිතකර මට්ටමේ විය.	පසුගිය වසර කිහිපයෙහි විගණකාධිපති මතය නිරීක්ෂණයේ දී යටත්ව මට්ටමේ /ව්‍යාවන මට්ටමේ /අහිතකර මට්ටමේ පවතින බව නිරීක්ෂණය විය. විගණකාධිපති විසින් ඉහත දක්වා ඇති ආකාරයේ මතයක් ප්‍රකාශ කිරීමට පාදක වූ කරුණු ඒ ඒ අවස්ථාවලදී හඳුනාගත් අතර, දක්වා ඇති දුර්වලතාවයන් අවම කර ගැනීම සඳහා අවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රම මේ වන විටත් ස්ථාපිත කර ක්‍රියාත්මක තත්ත්වයේ පවතී.
විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	විගණකාධිපති විසින් දක්වා ඇති නිර්දේශ උපරිම අයුරින් ක්‍රියාත්මක කිරීම මඟින් අභ්‍යන්තර පාලන ක්‍රමය ස්ථාපිත කළ අතර, මේ වන විටත් විගණකාධිපතිගේ නිර්දේශ ක්‍රියාකාරී තත්ත්වයේ පවතී.
නිලධාරීන්ගෙන් රජයට සිදු වූ පාඩු වෙනුවෙන් මු.රෙ.156(1) ප්‍රකාරව අය කිරීම් කර නොතිබුණි.	නිලධාරීන්ගෙන් රජයට සිදු වූ පාඩු පිළිබඳ ගණනය කිරීම් සිදුකර මු.රෙ.156(1) ප්‍රකාරව නියමිත අය කිරීම් සිදු කිරීමට අවශ්‍ය පූර්ව කටයුතු සිදු කරන ලෙස නිලධාරීන් දැනුවත් කර ඇත.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාර්
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල

උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබීම.	I. 2020 වර්ෂයේදී රටේ පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් වාර්ෂික ස්ථාන මාරු සිදු කිරීමට නොහැකි වූ අතර 2021 වර්ෂයේදී වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන ලදී. II. 2022 වර්ෂයේ පැවති ආර්ථික අර්බුදයන් සමඟ නිලධාරීන් වෙත ස්ථාන මාරු සිදු කිරීමේදී නිලධාරීන් වෙත මුහුණ පෑමට සිදුවන අපහසුතාවයන් හේතු කොට ගෙන ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම සිදු නොකරන ලදී. III. දෙපාර්තමේන්තුවට අනුයුක්තව දීර්ඝ කාලයක් එකම දිස්ත්‍රික් කාර්යාලයක් තුල, ගොවිජන සේවා මධ්‍යස්ථානයක් හෝ කෘ.ප.නි.ස වසමක් තුල සේවය කරන ගොවිජන සංවර්ධන නිලධාරී, සංවර්ධන නිලධාරී සේවය, මධ්‍යස්ථාන කළමනාකරණ සහකාර, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර, කම්කරු, මුරකරු යන තනතුරු සඳහා 2023.05.02 දින අභ්‍යන්තර ස්ථාන මාරු පටිපාටියක් සකසා ක්‍රියාත්මක කර ඇත. IV. 2023 වර්ෂයේදී නිලධාරීන් ස්ථාන මාරු කිරීම් සිදු කරන ලද අතර 2024 වර්ෂයේදී වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු වීම් සඳහා නිලධාරීන් වෙතින් අයදුම්පත් කැඳවන ලෙස සියළුම දිස්ත්‍රික් කාර්යාල දැනුවත් කර ඇත. V. එමෙන්ම, 2024 වර්ෂයේ ද එම ක්‍රියාවලිය අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.